# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2063/5 – 2018 මාර්තු 19 වැනි සඳුදා – 2018.03.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

33 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: අඹකෝ/3/4/අ/140-iv.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම්, ආර්. ටී. පී. සුමනසේකර වන මා විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 33 වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම අත්කර ගැනීම සඳහා නියමිත වන්දි පොළී මුදල වන රුපියල් විසිනව ලක්ෂ හතලිස් දහස් හයසිය විසි පහයි ශත අසූවක් (රු. 2,940,625.80) අයිතිකරුවන්ට ලබාගැනීම පිණිස හැටන් දිසා අධිකරණයේ නඩු අංක එල්ඒ/05/2018 යටතේ බැර කර ඇති බව මෙයින් දන්වමි.

ආර්. ටී. පී. සුමනසේකර,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය.

2018 මාර්තු මස 14 වැනි දින.

උපලේඛනය

| | | |
|---|---|---|
| ඉඩමේ නම | : | නීලවත්ත |
| පිඹුරු අංකය | : | අ.ග.පි. 115 හි අතිරේක 44 පත්‍ර අංක 45 |
| කැබලි අංකය | : | 1087 සහ 1089 |
| ප්‍රමාණය | : | හෙක්. 1.7957 |
| පිහිටීම | : | මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දාගම්පිටිය ග්‍රාම නිලධාරී වසමේ මොරහේනගම ගම |
| මුදල් තැන්පත් බැංකුව හා ශාඛාව | : | ජාතික ඉතිරිකිරීමේ බැංකුව, හැටන් |
| ගිණුම් අංක | : | 101160177482 |

04 – 01


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.